**නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම සඳහා පදනම් යෝජනා මාලාවක් ඉකුත් සැප්තැම්බර් මස 21 වෙනිදා අගමැතිවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබ තිබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදක මෙහෙයුම් මණ්ඩලය විසින් සකස් කරන ලද එම යෝජනා මාලාව (අතුරු වාර්තාව) මේ වන රට තුළ මහත් විසංවාදයකට බඳුන්ව තිබේ. එහිදී ප්‍රබල ලෙස ඉස්මතු කෙරන කාරණා සම්බන්ධයෙන් මෙහෙයුම් කමිටු සාමාජික ආචාර්ය ජයම්පතී වික්‍රමරත්න සමඟ කරන ලද සාකච්ඡාවකි මේ. ඔහු 'ජනවාරි 8 ' වෙනසේදී පූජ්‍ය මාදුළුවේ සෝභිත හිමියන් සමඟ එක්ව වැඩ කළ වාමාංශික දේශපාලනඥයෙකි. ජනාධිපති නීතිඥවරයෙකි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය පිළිබඳ කෘතහස්ත බුද්ධිමතෙකි.**



# දේශපාලන ප්‍රතිසංස්කරණයක් සඳහා ලැබෙන අවසන් අවස්ථාව මෙයයි

## ජනාධිපති නීතිඥ ආචාර්ය ජයම්පතී වික්‍රමරත්න (පා.ම.)

- ඒකීය භාවයේ වෙනසක් නෑ
- බුද්ධාගමට හිමි තැනේ වෙනසක් නෑ
- පාර්ලිමේන්තුවෙන් පත් කෙරෙන විධායක ජනාධිපති ධුරයක්
- පළාත් සභාවලට පුළුල් බලතල
- මිශ්‍ර මැතිවරණ ක්‍රමයක්

**නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කරගැනීම සඳහා වන මෙහෙයුම් කමිටු අතුරු වාර්තාව අග්‍රාමාත්‍යවරයා පසුගිය 21 වෙනිදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. එය සකස් කෙරුණේ කොහොමද ?**

2015 ජනවාරි 8වෙනිදා රටේ සිදුවූ දේශපාලන වෙනසේදී හැට දෙලක්ෂ දාහත්දහසකට අධික රටේ බහුතර ජනතාවගේ ප්‍රධාන අභිලාෂය වුණේ පවතින දේශපාලන ක්‍රමයේ ශීලාචාර වෙනසක් ඇති කරගැනීමයි. ඒ සඳහා විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම ඇතුළුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික සංශෝධනයක් සිදු කිරීම අත්‍යවශ්‍ය කාරණයක් බවට පත්ව තිබුණා. 'ජනවාරි 8' වෙනසේදී පොදු අපේක්ෂකයා ලෙස ජනාධිපති ධුරයට පත් මෛත්‍රීපාල සිරිසේන මහතාත්, අගමැති ධුරයට පත් රනිල් වික්‍රමසිංහ මහතාත් ඔවුන්ගේ මැතිවරණ ව්‍යාපාර තුළදී වගේම ජයග්‍රහණයන්ගෙන් පසුවත් ඒ වෙනස සිදුකරන බවට ජනතාවට පොරොන්දුවී තිබුණා. ඒ අනුව 2016 ජනවාරි 9 වෙනිදා ආණ්ඩුව වෙනුවෙන් අග්‍රාමාත්‍යතුමා පාර්ලිමේන්තුවට යෝජනාවක් ඉදිරිපත් කළා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය සඳහා ''ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයක්'' පිහිටුවීම පිළිබඳව. එදා එයට සහයෝගය දීම සඳහා ජනාධිපතිතුමත් පාර්ලිමේන්තුවට පැමිණියා.

ඉන් පසුව එම යෝජනාව යම් සංශෝධන සහිතව 2016 මාර්තු 09 වෙනිදා පාර්ලිමේන්තුව තුළ ඒකමතිකව සම්මත වුණා. ඒ අනුව නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය සඳහා පාර්ලිමේන්තුවේ 225 දෙනාගෙන්ම සමන්විත පාර්ලිමේන්තු කාරක සභාවක් පිහිටුවීම සිදු වුණා. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පතක් සකස් කිරීම එම කාරක සභාවට පැවරුණා. ඒ සමඟම එම කාරක සභාවට සහාය වීම සඳහා අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුතුව විසිඑක් දෙනෙකුගෙන් යුත් මෙහෙයුම් කමිටුවක් පත් කරනු ලැබුවා. එම 21 දෙනාව පත් කළෙත් ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයෙන්, ඒ කියන්නේ පාර්ලිමේන්තුවෙන් ඒකමතිකව. එම මෙහෙයුම් කමිටුව සකස් කළ අතුරු වාර්තාව තමයි අගමැතිතුමා එදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ.

**මොනවද එහි ඇතුළත්වන ප්‍රධාන කාරණා?**

රාජ්‍යයේ ස්වරූපය, විධායකය, මැතිවරණ ක්‍රමය, බලය බෙදා හැරීම පිළිබඳ මූලධර්ම, ආගම සහ ඉඩම් යන විෂයයන් පිළිබඳව, මෙහෙයුම් කමිටුව සෘජුවම කරුණු විමසා සකස් කළ යෝජනා මෙහි ඇතුළත් වෙනවා. මෙහෙයුම් කමිටුව පිහිටුවනවාත් සමඟම සෙසු විෂයන් හයක් පිළිබඳව කරුණු සොයා බලන්න අනු කමිටු හයකුත් පත් කළා. මූලික අයිතිවාසිකම්, නීතිය හා සාමය, අධිකරණය, මධ්‍ය කේන්ද්‍රය සහ පර්යන්තය අතර සම්බන්ධතාවය, රාජ්‍ය මුල්‍ය හා රාජ්‍ය සේවය පිළිබඳව. ඒ අනුකමිටුවලින් ඒ ඒ විෂයන් ගැන ඉදිරිපත් කළ යෝජනා මෙම අතුරු වාර්තාවේ ඇතුළත් කොට නැහැ. අපි ඊළඟ පියවර වශයෙන් බලාපොරොත්තු වන්නේ මෙහෙයුම් කමිටු වාර්තාව සහ අනු කමිටු හය වෙන් වෙන්ව සකස් කළ වාර්තා සියල්ලේම ඇතුළත් කරුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව තුළ, ඒ කියන්නේ පාර්ලිමේන්තුව තුළ සාකච්ඡා කරන්නයි.

**වත්මන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බුද්ධාගමට දී ඇති ප්‍රමුඛස්ථානය අහෝසි කරන්නට මෙහෙයුම් කමිටු අතුරු වාර්තාව යෝජනා කොට ඇති බවට බුද්ධ ශාසන කාර්ය සාධක මණ්ඩලය චෝදනා කරනවා. එසේ සිදුවී තිබෙනවාද?**

වත්මන් ව්‍යවස්ථාවේ 11 වෙනි පරිච්ඡේදයේ බුද්ධාගම පිළිබඳ මෙලෙස සඳහන්වී තිබෙනවා. ''**ශ්‍රී ලංකා ජනරජය බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේය... බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේය**.'' කියලා. කලින් තිබුණු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවල මෙහෙම දෙයක් තිබුණේ නෑ. දේශපාලන වුවමනාවන් වෙනුවෙන් 78 ව්‍යවස්ථාවට ඇතුළත් කළ වගන්තියක් එය. කෙසේ වුවත් ව්‍යවස්ථාවේ මෙසේ සඳහන් වීමෙන් බුද්ධාගමට විශේෂයෙන් යම් ප්‍රතිලාභයක් ලැබෙන්නේ නෑ. හෙළ උරුමයේ පාඨලී චම්පික රණවක පවා පවසා තිබෙනවා ව්‍යවස්ථාවේ ඇතුළත් ඒ වගන්තිය හුදු සැරසිල්ලක් පමණක් බව. ව්‍යවස්ථාවේ එසේ විශේෂ සඳහනක් තිබීම නුසුදුසු බවට ඇතැම් පාර්ශ්වයන් වෙතින් මෑතක සිට අදහස් ඉදිරිපත් වෙනවා. මේ අදහස ලාල් විජේනායක මහජන අදහස් විමසීමේ කමිටුවටත් ඉදිරිපත්වී තිබුණා. දෙමළ සමාජයේ අදහස සෑම ආගමකටම සම තැන දිය යුතු බවයි. නමුත් පවතින ප්‍රායෝගික තත්ත්වයන් තුළ බුද්ධාගමට ව්‍යවස්ථාවෙන් හිමි තැන වෙනස් කිරීමට යාම නව ව්‍යවස්ථාවක් සම්මත කරගැනීමේ සමස්ථ වැඩපිළිවෙළම අර්බුධයකට ගෙනයා හැකියි. ඒ නිසා එයට අත නොතැබීමට මෙහෙයුම් කමිටුව තීරණය කළා. ඒ කියන්නේ වත්මන් ව්‍යවස්ථාවෙන් බුද්ධාගමට හිමිව ඇති ස්ථානයේ කිසිදු වෙනසක් යෝජිත නව ව්‍යවස්ථාවෙන් සිදුකරන ලෙස මෙහෙයුම් කමිටු වාර්තාව යෝජනා කරන්නේ නෑ.

**රාජ්‍ය අනාගමිකවීම දියුණු ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයක් නොවෙයිද?**

ශ්‍රේෂ්ඨාධිකරණය නඩු දෙකකදී කියා තිබෙනවා දැනටත් ශ්‍රී ලංකා රාජ්‍ය අනාගමිකයි කියා. සරත් සිල්වා සහ ශිරාණි තිලකවර්ධන ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරු ඒ බව ප්‍රකාශ කොට තිබෙනවා. හෙළ උරුමය පක්ෂය පවා කියන්නේ බුද්ධාගම රාජ්‍ය ආගම බවට පත් කර නොමැති අතර ව්‍යවස්ථාමය සැරසිල්ලක් පමණයි කියලා. 1815 ගිවිසුම වෙලාවේ බුද්ධාගමට ලැබුණු සහතිකයට අනුව තමයි බෞද්ධයන්ගේ පාර්ශ්වයෙන් මේ ව්‍යවස්ථාපිත සහතික කිරීම ඉල්ලන්නේ.

72 ව්‍යවස්ථාව හදන විට මුල් යෝජනාව කොල්වින් ඉදිරිපත් කළේ වැඩිදෙනාගේ ආගම වන බුද්ධාගමට නිසි තැන දිය යුතුය කියායි. එය වෙනස් වුණේ ෆීලික්ස් ඩයස් බණ්ඩාරනායකගේ මැදිහත්වීමෙන්. ෆීලික්ස් ඩයස් දි.මු. ජයරත්නලා ආදීන්ට කිව්වා බුද්ධාගම රාජ්‍ය ආගම කරන ලෙස ඉල්ලන්න කියලා. ඔවුන් එසේ කළා. ඒ ඉල්ලීමත් සමග රට ගිනි ගත්තා. ඉන් පසුව ඔය අදහස් දෙක අතරට තමයි දැන් තියන වගන්තිය ගෙනත් දාලා තියෙන්නේ.

**මෙහෙයුම් කමිටු වාර්තාවේ බුද්ධාගම සම්බන්ධයෙන් මොනවද ඇතුළත් වෙන්නේ?**

අතුරු වාර්තාවෙන් යෝජනා දෙකක් ඉදිරිපත් කර තිබෙනවා. මූලිකවම බුද්ධාගම සම්බන්ධයෙන් වත්මන් ව්‍යවස්ථාවේ පවතින වගන්ති කිසිදු වෙනසක් නොකොට ඒ ආකාරයෙන්ම තිබිය යුතු බව යෝජනා කරනවා. දෙවෙනි යෝජනාවේ මෙසේ සඳහන් වෙනවා. ''ශ්‍රී ලංකාව බුද්ධාගමට ප්‍රමුඛස්ථානය පිරිනමන්නේය. එහෙයින් සියලු ආගම් හා විශ්වාසයන්ට ගෞරවයෙන් සහ අභිමානයෙන් සළකමින් හා වෙන්කොට සැළකීමකින් තොරව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහතික කර ඇති මූලික අයිතිවාසිකම් සියලුම පුද්ගලයන්ට සහතික කරමින්, බුද්ධ ශාසනය සුරක්ෂිත කොට පෝෂණය කිරීම රජයේ වගකීම විය යුත්තේය” කියලා. ඒ යෝජනාවෙන් පවා වත්මන් ව්‍යවස්ථාවෙන් බුද්ධාගමට හිමි තැන කිසිදු ආකාරයක වෙනසකට ලක්කොට නොමැති බව අතුරු වාර්තාව කියවා බැලූවිට තේරුම් ගත හැකියි. එයින් කියන්නේ අනෙකුත් ආගම් සහ විශ්වාසයන්ටත් සමාන තැනක් දෙන්න කියලයි. එසේ ඉල්ලීමට අනෙකුත් ආගම් සහ විශ්වාසයන් අදහන අයට අයිතියක් තියනවා.



**සාකච්ඡා කළේ**
**ශ්‍රීලාල් සෙනෙවිරත්න**

20 වන පිටට